# තනතුරු ඇබෑර්තු

සී/ස මොනරාගල කදුකර විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති සාමාන්‍යාධිකාරී තනතුර සඳහා 2026/06/20 දින සිට 2026/07/19 දින දක්වා දිවයින පුරා අයදුම්පත් කැඳවනු ලැබේ. තමා විසින් සකස් කර ගන්නා ලද අයදුම්පත් **සභාපති, සීමාසහිත මොනරාගල, කදුකර විවිධ සේවා, සමුපකාර සමිතිය, වැල්ලවාය පාර, මොනරාගල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"සාමාන්‍යාධිකාරී තනතුර"** වශයෙන් සඳහන් කළ යුතුය.

**වැටුප් පරිමාණය :** 55,000 – 560X7 – 630X9 – 700x11 – 790X12- 81,770

**බඳවා ගැනීමේ සුදුසුකම්**

**වයස් සීමාව :** අවුරුදු 21- 45

**සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණ / කළමනාකරණ /වාණිජ / ගණකාධිකරණ / ආර්ථික විද්‍යාව විෂය ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.

   හා

   පිළිගත් ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ මාස 06කට නොඅඩු පාඨමාලාවක් හදරා තිබීම.

   හා

   පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 01 කට නොඅඩු පළපුරුද්ද.

   හෝ

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකට අදාළ උපාධියක් ලබා තිබීම.

   හා

   පිළිගත් ආයතනයක ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ වසර 01කට නොඅඩු ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

   හා

   පිළිගත් ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ මාස 06කට නොඅඩු පාඨමාලාවක් හදරා තිබීම.

   හා

   පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

**සභාපති,**
**සී/ස මොනරාගල කදුකර විවිධ සේවා සමුපකාර සමිතිය.**
**දුරකථන අංකය :- 0552276089**